**විල්ගමුව ප්‍රාදේශීය සභාව.**

**------------------------**

**මාතලේ දිස්ත්‍රික්කය.**

**---------------------**

**01. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

**--------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 06 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 27 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**1.2 මතය**

**------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට විල්ගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**---------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

**----------------------**

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ නිවාස ආධාර ලබාදීම යටතේ ආධාර ලාභියෙකුට රු.24,390 ක් ගෙවා තිබියදීත් එම මුදල ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණු රු.8,000 ක ඇප මුදල ඇප ආයෝජන ගිණුමට ගලපා නොතිබුණු අතර, ඇප ආයෝජන මත ලද පොලී ගිණුම්ගත කර නොතිබුණි. එමෙන්ම වර්ෂය තුළ නිදහස් කරන ලද රු.31,470 ක සේවක ඇප වලට අදාළ ගැලපීම් කර ගිනුම් ශේෂ නිවැරදි කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු පරිගනක යන්ත්‍ර 02 ක් හා මුද්‍රණ යන්ත්‍රයක සහ ප්ලාස්ටික් පුටු 26 ක හා රැස්වීම් ශාලා පුටු 20 ක වටිනාකම මෙන්ම සභාව සතුව පැවති මෝටර් රථ 04 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු.40,500 ක් අඩුවෙන්ද, සේවක වැටුප් ප්‍රතිපූර්ණය රු.251,939 ක් වැඩියෙන්ද ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ලේඩියංගල මහජන පුස්තකාලයේ ආරක්ෂිත වැට ඉදිකිරීමේ කර්මාන්තය සඳහා රඳවා ගැනීම් මුදල් වෙනුවෙන් රු.30,868 ක ප්‍රතිපාදන ලැබී තිබියදීත්, එම මුදල ණයගැතියන් යටතේ දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය විසින් ලබා දී තිබුණු රු.628,856 ක් වූ ගැල්වනයිස් බට 568 හි වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**

---------------------------

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන එකතුව රු.78,855,117ක් වූ ගිණුම් විෂයන් 13 කට අදාල ශේෂයන් ඒවාට අදාල උපයෝගි ලේඛණ හා වාර්තා වල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී නිරීක්ෂණය වූ අසමානතා වල එකතුව රු.13,640,469 ක් විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම**

------------------

ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල අවිනිශ්චිත ගිණුම යටතේ ඇතුළත් කර තිබුණු රු.657,609 ක බැර ශේෂයට අවශ්‍ය ගැලීපීම් කර ගිණුම් නිරවුල් කිරීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේදීත් එම වටිනාකම් මූල්‍ය ප්‍රකාශන වල ඉදිරියට ගෙනවිත් තිබුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

--------------------------------

දීර්ඝ කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශන වල ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.4,455,227 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක වටිනාකම් සහ ගෙවිය යුතු රු.1,136,595 ක් වූ ගිණුම් ශේෂ 02 ක අගය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

එකතුව රු.28,140,129 ක් වූ ගිණුම් විෂයන් 06 කට අදාළ සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා එම ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.6 නීති, රීති රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත විස්තර දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති,රීති රෙගුලාසි යනාදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12 (1) (2) වගන්තිය | ප්‍රාදේශීය සභාවේ කටයුතු කරගෙන යාමේ දී උපදෙස් ලබාදීම සඳහා මුදල් හා ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය, කාර්මික සේවා සහ පරිසරය යන පහසුකම් සම්බන්ධ කමිටු පත්කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දී පරිසර කමිටුව පමණක් පත්කර තිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය පරිපාලන) රීති මාලාවේ අංක 217 රීතිය | සභාවට පවරාදෙන ලද, සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා සහ සභාව විසින් පදිංචියට යොදා ගෙන ඇති සියලුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබද විස්තර ඇතුළත් කර පී.එස්.46 ආකෘතිය ප්‍රකාරව ලේඛණයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 වගන්තිය | ණය ගෙවීම් පැහැර හරින ලද සේවකයින් 08 දෙනෙකුගෙන් අය විය යුතුව තිබුණු රු.58,112 ක ආපදා ණය ශේෂ සහ රු.21,251 ක් වූ වාහන ණය ශේෂ ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.455,125 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,313,985 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,858,860 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

## 2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

-----------------------------------

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය හා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ වැදගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

**(අ)** වර්ෂයේ මෙහෙයුම් ආදායමට සාපේක්ෂව අතිරික්තය ඉකුත් වර්ෂයේ පැවති තත්ත්වය සමඟ සැසඳීමේදී ඉතා අඩු අගයක් ගන්නා බව නිරීක්ෂණය විය.

**(ආ)** වර්ෂයේ මුළු ආදායමින් මුළු වියදම් සියයට 98 ක් වූයෙන් සභාවේ ආදායමට සාපේක්ෂව වියදම ඉතා ඉහළ මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

**(ඇ)** සමාලෝචිත වර්ෂය තුළ ජංගම වත්කම් ශේෂය ඉක්මවා ජංගම වගකීම් පැවතින. එය ද්‍රවශීලතාවය සම්බන්ධයෙන් බලන කළ සතුටුදායක තත්ත්වයක් නොවන බව විගණනයේ අදහසයි.

## 2.3 ආදායම් පරිපාලනය

----------------------

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය.

-------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට සභාවේ ආදායම් රැස්කිරීමේ තත්ත්වය පිළිබඳ සාරාංශ ගත විස්තරයක් පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2014.01.01 දිනට හිඟය | 2014 වර්ෂයේ බිල් කිරීම් | ලැබිය යුතු මුළු මුදල | ආරම්භක හිගයෙන් ලැබීම් | වර්ෂයේ බිල් කිරීම් වලින් ලැබීම් | මුළු ලැබීම් | 2014.12.31 දිනට හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 502,089 | 633,959 | 1,136,048 | 184,369 | 553,106 | 737,475 | 398,573 |
| බදුකුලී | 900,069 | 1,327,150 | 2,227,219 | - | 1,327,150 | 1,327,150 | 900,069 |
| බලපත්‍ර ගාස්තු | 1,985 | 512,803 | 514,788 | - | 512,803 | 512,803 | 1,985 |
| සේවා සඳහා ගාස්තු | 733,323 | 1,475,788 | 2,209,111 | 346,939 | 1,040,816 | 1,387,755 | 821,356 |
| වරෙන්තු ගාස්තු සහ දඩ | 892,382 | 2,274,515 | 3,166,897 | 892,382 | 882,629 | 1,775,011 | 1,391,886 |
| | | | | | | | **3,513,869** |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආරම්භක වරිපනම් බදු හිඟයෙන් වර්ෂය තුළ අයකරගෙන තිබුණේ සියයට 36 කටත් වඩා අඩු ප්‍රතිශතයකි. ඒ අනුව තවදුරටත් රු.317,720 ක හිඟ ශේෂයක් පැවැතුණි.

(ආ) බදු කුලී සහ බලපත්‍ර ගාස්තු හිඟ ශේෂ වලින් කිසිදු මුදලක් වර්ෂය තුළ අයකරගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ප්‍රධාන ආදායම් ශීර්ෂ 5 හි හිඟ ආදායම් වල එකතුව රු.3,513,869 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි.

## 03 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වර්ෂ 2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වගන්තිය යටතේ වූ නියමයන් පරිදි වී මෝල් 47 කින්, ලැඟුම්හල් හා නිවාඩු නිකේතන 08 කින් අයවිය යුතු එකතුව රු.385,000 ක් වූ බලපත්‍ර ගාස්තු අයකර ගෙන නොතිබුණි.

(ආ) 2014 වර්ෂය තුළ සභාව විසින් රැස්කර ගෙන තිබුණු රු.45,926 ක මුද්දර ගාස්තු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව සතු බස් රථය දින දෙකක කුලී ගමනක් යාම සඳහා විල්ගමුව පොලීසිය විසින් අවිධිමත්ව ලබාගෙන තිබුණු අතර, ඒ වෙනුවෙන් අයවිය යුතු රු.14,400 ක මුදල සභාවට අයකරගෙන නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොගෙන ඉකුත් වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදි එකතුව රු.67,500 ක් වූ ඉන්ධන දීමනා සභා මන්ත්‍රීවරුන්ට ගෙවා තිබුණි.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් කර්මාන්ත සම්බන්ධයෙන් 2014 නොවැම්බර් 28 දින කරන ලද භෞතික පරික්ෂාවේදි අනාවරණය වු කරුණු පහත දැක්වේ.

(අ) පුස්සැල්ලයාය ට්‍රාන්ස් පෝමරය අසල මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ වැඩ විෂය අංක 02 යටතේ සිදුකල $20.3m^3$ ක් 1:2:4 මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් යෙදීම සඳහා රු.255,550 ක් ගෙවා තිබුණද, නිසි ප්‍රමිතියෙන් තොර කොන්ක්‍රීට් යොදා ඇති බවත් එම කොන්ක්‍රීට් කැඩී යා හැකි මට්ටමේ පවතින බවත් නිරීක්ෂණය විය.

(ආ) කුඹුක්ඔය සුසානාගාරය ඉදිකිරීමේ කර්මාන්තයට අදාල ඇස්තමේන්තුවේ අංක 11 හා 12 දරන වැඩ විෂයන් යටතේ යොදා ඇති පරාල සහ යට ලී නියමිත ප්‍රමිතයෙන් හා ශක්තිමත් බවින් තොරබවත්, යට ලීයේ විශාල ප්‍රමාණයේ කුහර සෑදී තිබුණු බවත් නිරීක්ෂණය විය.

**3.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

-------------------------------

සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතු කෙරෙන කසල ප්‍රතිචක්‍රීකරණය වැඩ පිළිවෙලකට යොදවා නොගෙන ට්‍රැක්ටරයක් මගින් දිනපතා නාමිනිඔය වැවට ඉහළින් ඇති රජයේ ඉඩමට අනාරක්ෂිත ලෙස බැහැර කරන බැවින් පරිසරයට මෙන්ම ප්‍රදේශයේ ගැවසෙන වන සතුන්ටද විවිධාකාරයේ ගැටළු වලට මුහුණ පෑමට සිදු වී ඇති බව නිරීක්ෂණය විය.

**04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

-------------------------------------

**4.1 අයවැය පාලනය**

-------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී අයවැය ලේඛනය මගින් වැය විෂයන් 37 ක් සඳහා සලසා දී තිබූ රු.679,000 ක ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් නොදරා වෙනත් වැය විෂයන්ට මාරු කිරීම් හා ඉතිරි කිරීම් සිදු කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය මගින් ආදායම් ශීර්ෂ 17 ක් යටතේ එකතුව රු.1,691,200 ක් වූ ආදායම් උපයා ගැනීමට ඉලක්ක කර තිබුණු නමුත්, කිසිදු ආදායමක් උපයාගෙන නොතිබුණි.

(ඇ) වියදම් ශීර්ෂ 17 ක ඇස්තමේන්තුගත වියදම් සීමාවන් ඉක්මවා රු.1,519,345 ක වියදම් දරා තිබුණි.

**4.2 නොවිසඳී ඇති හා පිළිතුරු නොලත් විගණන විමසුම්**

--------------------------------------------------

2015 මාර්තු 31 දින වන විට සභාව වෙත ඉදිරිපත් කරන ලද විගණන විමසුම් වලින් විමසුම් 05 කට පිළිතුරු සපයා නොතිබුනු අතර එකී විමසුම් වලට භාජනය වූ ගනුදෙනු වල ගණනය කළ හැකි වටිනාකම රු.3,509,702 ක් විය.

**05.** **පද්ධති හා පාලන**

**-------------------**

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) කොන්ත්‍රාත් පාලනය